**ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව - 2018**

-----------------------------------------------------

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ ගනුදෙනු හා ක්‍රියාකාරකම් 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා සංස්ථාවේ මෙහෙයුම් පිළිබඳව පාර්ලිමේන්තුවට සභාගත කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

-----------------

**2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

----------------------------------

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීමක් වුවත්, 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පීඊඩී/12 හි 6.5.1 වගන්තිය ප්‍රකාරව 2017 වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන 2019 සැප්තැම්බර් වන විටත් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

**2.2 සංස්ථාවේ ක්‍රියාකාරකම් පිළිබඳ අදහස්**

--------------------------------------------

**2.2.1 සංස්ථාවේ මුදල් ප්‍රවාහය**

----------------------------

සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ එක් එක් අංශයේ මුදල් ප්‍රවාහ තත්ත්වය පහත පරිදි වේ.

(අ) විගණනයට සපයන ලද තොරතුරු අනුව, සේවා අංශය හා ඉදිකිරීම් උපාංග අංශය රු.161,516,310 ක හා රු.5,956,669 ක සෘණ මුදල් ප්‍රවාහයක් පෙන්නුම් කර තිබූ අතර ඉදිකිරීම් අංශය, යාන්ත්‍රික හා විදුලි අංශය, උපදේශන අංශය හා විශේෂ මෙහෙයුම් අංශය රු.94,096,400 , රු.10,172,204 , රු.5,956,669 , රු.20,426,983 හා රු.7,397,000 ක ධන මුදල් ප්‍රවාහයක් පෙන්නුම් කර තිබුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස 2018 වර්ෂය අවසානයට සංස්ථාවේ ශුද්ධ මුදල් ප්‍රවාහයේ රු.35,380,391 ක සෘණ ශේෂයක් පෙන්නුම් කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය ආරම්භයේ සිට අවසානය දක්වා සංස්ථාවේ මුළු මුදල් ගලායාමේ ප්‍රවාහයෙන් මූල්‍ය මුදල් ගලායාම් ප්‍රවාහය සියයට 05 සිට සියයට 9.2 දක්වා වැඩි වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා සංස්ථාවේ මුළු මුදල් ගලායාමේ ප්‍රවාහයෙන් බැංකු අයිරා පොළී පිරිවැය සියයට 1.9 සිට සියයට 09 දක්වා වැඩිවී තිබුණි.

(ඈ) සංස්ථාව කිහිප වතාවක් බැංකු ණය ලබාගෙන තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානයේදී ගෙවිය යුතු ශේෂය රු. මිලියන 1,720 ක් විය. කෙසේවෙතත්, 2018 වර්ෂය අවසානයේදී ශුද්ධ මුදල් ප්‍රවාහයේ රු.15,006,067 ක සෘණ ශේෂයක් පෙන්නුම් කර තිබුණි.

## 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත හා 1980 අංක 46 දරන සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් පනත | 2006 ජනවාරි සිට 2015 ජූලි දක්වා ජීවන වියදම් දීමනාව සේවකයින්ට ගෙවීම මත සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා දායකය පිළිවෙලින් රු. මිලියන 307.82 ක් හා රු. මිලියන 41.97 ක් ප්‍රේෂණය නොකිරීම හේතුවෙන් අධිභාර ලෙස පිළිවෙලින් රු. මිලියන 153.91 ක් හා රු. මිලියන 20.98 ක් සංස්ථාවට ගෙවීමට සිදුවී තිබුණි. |
| (ආ) | 1979 දෙසැම්බර් 20 දිනැති හා ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ සභාපති විසින් නිකුත් කරන ලද අංක 121/1979 දරන චක්‍රලේඛයේ 2 (ඇ) වගන්තිය | ඇණවුම් සමග වෙක්පත් අත්තිකාරම් ලබාදීමෙන් පසු දින 30 ක් ඇතුළත එවැනි අත්තිකාරම් නිරවුල් කළ යුතුය. එසේවුවත්, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ (SEC) එකතුව රු.85,220,662 ක් වූ මෙවැනි අත්තිකාරම් 1999 සිට 2018 දක්වා වූ කාල පරිච්ජේදයට අදාලව නිරවුල් නොකර පැවතුණි. තවද, ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයේ (NEMO) එකතුව රු.6,445,194 ක් වූ ඇණවුම් සමග වෙක්පත් අත්තිකාරම් 2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා නිරවුල් නොකර පැවතුණි. |
| (ඇ) | 1979 දෙසැම්බර් 20 දිනැති හා ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ සභාපති විසින් නිකුත් කරන ලද අංක 122/1979 දරන චක්‍රලේඛයේ 4 වන වගන්තිය | භාණ්ඩ හා සේවා සැපයීම සඳහා මුදල් අත්තිකාරම් ලබාදීමෙන් පසු එවැනි අත්තිකාරම් දින 14 ක් ඇතුළත නිරවුල් කළ යුතුය. කෙසේ වෙතත්, 2017 හා 2018 වර්ෂයට අදාල රු.1,012,000 ක හා රු.1,257,890 ක මුදල් අත්තිකාරම් 2019 අගෝස්තු අග වන විටත් නිරවුල් නොකර පැවතුණි. තවද, ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයේ 2016, 2017 හා 2018 වර්ෂ වලට අදාල රු.2,216,480 ක, රු.606,790 ක හා රු.6,332,538 ක මුදල් අත්තිකාරම් 2019 අගෝස්තු අග වන විටත් නිරවුල් නොකර පැවතුණි. |
| (ඈ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 (අ) මාර්ගෝපදේශය | රු.55,338,226 ක වටිනාකමින් යුත් ඉදිකිරීම් කොන්ත්‍රාත් 07 ක් සම්බන්ධයෙන් ඉදිකිරීම් වැඩ ආරම්භ වීමට පෙර කාර්යසාධන බැඳුම්කර ලබාගෙන නොතිබුණි. |
| (ඉ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 (ආ) මාර්ගෝපදේශය | කාර්යසාධන බැඳුම්කරවල වලංගු කාලය ඉකුත් වී තිබූ නමුත් සංස්ථාව විසින් රු.39,165,796 ක වටිනාකමකින් යුතු දැනට කෙරිගෙන යනඉදිකිරීම් කොන්ත්‍රාත් 04 ක් සඳහා කාලය දීර්ඝ කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------------

### 3.1 කාර්යසාධනය

------------------

සංස්ථාවේ ප්‍රධාන අරමුණු වූ (i) සිවිල් ඉංජිනේරු හා අනෙකුත් ඉංජිනේරු ව්‍යාපෘති විමර්ෂනය කිරීම,සැලසුම් කිරීම, නිර්මාණය කිරීම සහ ඉදිකිරීම් කටයුතු ක්‍රියාත්මක කිරීම (ii) ව්‍යාපෘති කළමනාකරණ සේවා හා උපදේශන සේවා සැපයීම (iii) දේපල සංවර්ධන කටයුතු අත්පත් කර ගැනීම (iv) පෙර සූදානම් කළ කොන්ක්‍රීට්, සවි ගැන්වූ කොන්ක්‍රීට් සහ පූර්ව ප්‍රත්‍යාබල කොන්ක්‍රීට් නිෂ්පාදනය කිරීම හා අලෙවි කිරීම (v) ඉංජිනේරු ව්‍යාපෘති සඳහා අවශ්‍ය හා ඒවා පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ගොඩනැගිලි ද්‍රව්‍ය, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ නිෂ්පාදනය කිරීම, අලෙවි කිරීම, ආනයනය කිරීම හා අපනයනය කිරීම (vi) ඉංජිනේරුමය හා ශිල්පීය කාර්ය මණ්ඩලය පුහුණු කිරීම (vii) ඉහත අරමුණු ඉටුකර ගැනීම සඳහා ඉදිකිරීම් ද්‍රව්‍ය, ඉදිකිරීම් විධික්‍රම හා ඉදිකිරීම් ශිල්පක්‍රම පිළිබඳ පර්යේෂණ කටයුතු ක්‍රියාවේ යෙදවීම වේ.

2018 වර්ෂය තුළදී ඉහත අරමුණු ළඟා කර ගැනීම සඳහා ප්‍රධාන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ඉදිකිරීම් අංශය

------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය තුළ රු. මිලියන 472.37 ක වටිනාකමින් යුත් ව්‍යාපෘති 05 ක් නිමකිරීමට අපේක්ෂා කර තිබුණද, සත්‍ය ප්‍රගතිය සියයට 45 සිට සියයට 85 ක පරාසයක පැවතුණි.

(ii) රු. මිලියන 8,650.7 ක වටිනාකමකින් යුත් ව්‍යාපෘති 04 ක ඉලක්කගත ප්‍රගතියෙන් සියයට 50 ක් ළඟාකර ගෙන නොතිබුණි.

(ආ) ඉදිකිරීම් උපාංග අංශය

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) රත්මලාන පෙරසවි අංගනය (වැඩබිම් අංක 343)

-----------------------------------------------------

අයවැයගත නිෂ්පාදනයට සාපේක්ෂව නිෂ්පාදනය රු. මිලියන 20.8 කින් හෙවත් සියයට 21 කින් අඩුවී තිබුණි. තවද, අයවැයගත විකුණුම් සමග සැසඳීමේදී සත්‍ය විකුණුම් රු. මිලියන 19 කින් හෙවත් සියයට 20 කින් අඩුවී තිබුණි.

(ii) දං කොටුව වැඩබිම (වැඩබිම් අංකය 1099)

-----------------------------------------------

ඉහත වැඩබිමේ අයවැයගත නිෂ්පාදනයට සාපේක්ෂව සත්‍ය නිෂ්පාදිතය සියයට 71 කින් පිරිහී තිබූ අතර, අයවැයගත විකුණුම් වලට සාපේක්ෂව සත්‍ය විකුණුම් සියයට 52 කින් අඩු වී තිබුණි.

(iii) වැලිකන්ද පෙරසවි අංගනය (වැඩබිම් අංකය 1738)

----------------------------------------------------------

අයවැයගත නිෂ්පාදනයට සාපේක්ෂව සත්‍ය නිෂ්පාදිතය රු. මිලියන 13.8 කින් හෙවත් සියයට 8 කින් පිරිහී තිබුණි.

(iv) දෙමටගොඩ කොන්ක්‍රීට් සිල්පර අංගනය (වැඩබිම් අංකය 1510)

---------------------------------------------------------------------------

දෙමටගොඩ කොන්ක්‍රීට් සිල්පර අංගනයේ ඉලක්කගත නිෂ්පාදිතයෙන් සියයට 21 ක් ළගාකර ගෙන නොතිබුණි.

(v) අංක 2292 දරන ව්‍යාපෘතියට අදාල අයවැයගත ප්‍රගතිය හා සැසඳීමේදි ව්‍යාපෘතියේ සත්‍ය ප්‍රගතිය සියයට 46 ක්ව පැවතුණි.

(ඇ) යාන්ත්‍රික හා විදුලි අංශය

----------------------------

පහත සදහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මාතලේ පිහිටි ඩොලමයිට් ව්‍යාපෘතිය රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව යටතේ ක්‍රියාත්මක වී තිබුණි. පෙර වර්ෂයට සාපේක්ෂව එහි නිෂ්පාදන ප්‍රමාණය පිරිහි තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ එහි මෙහෙයුම් අලාභය රු.මිලියන 10.5 ක්ව තිබුණි. තවද, 1992 සිට 2017 දක්වා වූ කාල පරිච්ජේදය සදහා රු.7,227,099 ක බදු කුලිය සංස්ථාව විසින් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට ගෙවිය යුතු බව නිරීක්ෂණය විය. එසේ වුවත්, සංස්ථාව විසින් 2018 වර්ෂය අවසානයට රු.මිලියන 1.5 ක් පමණක් ගෙවා තිබුණි. මීට අමතරව, ඩොලමයිට් කැනීමේ බලපත්‍රය භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශයෙන් අලුත් කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස වැඩබිමෙහි නිෂ්පාදන කටයුතු අත්හිටුවා තිබුණි.

(ii) විගණනයට සපයන ලද තොරතුරු අනුව,වැඩ නොතිබිම හේතුවෙන් අයවැයගත ප්‍රගතියට සාපේක්ෂව වැඩපලවල්හි සත්‍ය ප්‍රගතිය සියයට 25 සිට සියයට 76 ක පරාසයක පැවතුණි.

(ඇ) මරදාන මගී පාලම

--------------------------------

පහත සදහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව 1992 වර්ෂයේදි කඩකාමර 100 කින් යුත් මරදාන මගි පාලම ඉදිකර තිබුණි. කඩ කාමර රු 450 සිට 650 දක්වා වූ මාසිකකුලී පරාසයකට පෞද්ගලික පාර්ශවයන්ට කුලියට දී තිබුණි. කෙසේ වෙතත්, 1992 වර්ෂයේ සිට 2018 දක්වා වර්ෂ 26 ක් තුල මෙම කඩ කාමර වල මාසික කුලිය වැඩි කර නොතිබුණි.

(ii) පාලමෙහි සමහර ස්ථානවලට හානිවීම් සිදුවී ඇති බව නිරීක්ෂණය වූ නමුත් ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව මෙම හානි පිළිසකර කිරීමට ක්‍රියා මාර්ග ගෙන නොතිබීම නිසා පාලම භාවිතා කරන මගීන්ට එය අවධානමක් වනු ඇත.

### 3.1.1 ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්

-----------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විගණනය විසින් ඉල්ලුම් කරන ලද, එකතු කල අගය මත බදු (VAT), ජාතිය ගොඩ නැගීමේ බදු (NBT), හා ආර්ථික සේවා ගාස්තු (ESC), සම්බන්ධයෙන් වන තොරතුරු ඉදිරිපත් කර නොමැති බැවින් එම බදුවල සත්‍ය ගෙවිය යුතු ශේෂය විගණනයේදි සතුටුදායක ලෙස තහවුරු කර ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) එකතුකල අගය මත බදු හා ජාතිය ගොඩනැගීමේ බදු වටිනාකම් පිළිවෙලින් රු.මිලියන 123.84 හා රු.මිලියන 7.8 ක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට යොමු කිරීම සඳහා සංස්ථාවට ප්‍රේෂණය කර නොතිබුණි.

(ඇ) 2002 සිට 2011දක්වා වූ කාලච්ඡේදය සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරියට ගෙවීමට තිබූ රු.මිලියන 235.8 ක් ගෙවා නොතිබුණි.

(ඈ) ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය සඳහා අනුමත සේවක සංඛ්‍යාව 344 ක් වුවද, 2018 දෙසැම්බර් 31 දිනට සත්‍ය සේවක සංඛ්‍යාව 785 ක් විය. කෙසේ වෙතත්, අතිරික්ත සේවකයින් 441 සඳහා ආයතනය විසින් අනුමැතිය ලබා ගෙන නොතිබුණි. තවද, ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය විසින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියෙන් තොරව නව තනතුරු 33 ක් නිර්මාණය කර තිබූ අතර ඉහත අනුමැතිය නොලත් තනතුරු 33 සඳහා සේවකයින් 62 ක් පත්කර තිබුණි.

### 3.2 මතභේදයට තුඩු දෙන කරුණු

----------------------------------------

විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු වලට අනුව, මාර්ග වැඩවල අවසන් බිල්පත් සම්බන්ධයෙන් ප්‍රමාණනය කිරීමේදී යෙදවුම් මැනීම සඳහා වෙනස් වූ පදනමක් භාවිතා කිරීම මත, ගාල්ල දිස්ත්‍රික්කයේ පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරුවන් 30 දෙනෙකුගෙන් රු.61,851,213 ක මුදලක් ලැබිය යුතු බව නිරීක්ෂණය විය. විගණන දිනය දක්වා අය කර ගෙන නොතිබුණි.

### 3.3 අනිකුත් රාජ්‍ය ආයතනවලට මුදාහැර තිබූ සම්පත්

---------------------------------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 වගන්තියට පටහැනිව, සංස්ථාවේ සේවකයින් 31 ක් නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයට, පළාත් අමාත්‍යාංශයට, ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට, රජයේ කර්මාන්ත ශාලා දෙපාර්තමේන්තුවට හා නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියට මුදාහැර තිබුණි. තවද, ඉහත චක්‍රලේඛයේ විධිවිධාන අනුව, මෙම සේවකයින්ගේ වැටුප් අදාල ආයතනවලින් ප්‍රතිපූර්ණය කර ගත යුතුය. කෙසේ වුවද, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයට මුදාහල සේවකයින් 11 දෙනෙකුගේ, ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට මුදාහල සේවකයින් 06 දෙනෙකුගේ, කර්මාන්ත ශාලා දෙපාර්තමේන්තුවට මුදාහල සේවකයින් 04 දෙනෙකුගේ හා නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියට මුදාහල සේවකයින් 05 දෙනෙකුගේ වැටුප් 2019 සැප්තැම්බර් 30 දින වන විටත් ප්‍රතිපූරණය කරගෙන නොතිබුණි.

### 3.4 නිෂ්කාර්ය වත්කම්

---------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සංස්ථාවට අයත් සී - සීටි ව්‍යාපෘතියේ ඉඩම සහ ගොඩනැගිල්ල ව්‍යාපෘතියේ අරමුණු ළගා කර ගැනීම සඳහා යොදා ගෙන නොතිබුණි.

(ආ) ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයේ ප්‍රධාන ගබඩාවේ රඳවා තිබූ සංස්ථාවට අයිති ඇළුමිනියම් බාර් හා සිවිලින් සීට් තොගයක් සංස්ථාව විසින් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

**3.5 හඳුනාගන්නා ලද පාඩු**

------------------------

එකතු කළ අගය මත බදු, ආර්ථික සේවා ගාස්තු හා ජාතිය ගොඩනැගීමේ බදු නියමිත කාලය තුළ නොගෙවීම නිසා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සංස්ථාව වෙත රු.114,399,641 ක අධිභාරයක් පනවා තිබුණි. තවද, එකතු කළ අගය මත බදු, ආර්ථික සේවා ගාස්තු හා ජාතිය ගොඩනැගීමේ බදු පිළිවෙලින් රු.628,504,287 ක්, රු. 67,996,943 ක් හා රු.15,130,647 ක් 2018 වර්ෂය අවසානය වන විටත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර නොතිබුණි.

**3.6 කාර්ය මණ්ඩල පරිපාලනය**

--------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2009 හා 2011 වර්ෂවලදී ජොෂ්ඨ කළමනාකරණ මට්ටමේ බොහෝමයක් තනතුරු සඳහා ස්ථිර පදනම මත බඳවා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සංස්ථාවට ලැබී තිබුණි. කෙසේ වුවත්, ජොෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරු 06 ක් සඳහා නිලධාරීන් 35 දෙනෙකු ඉහළ වැටුප් තලයන් යටතේ කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණි. තවද, සුපරීක්ෂකවරු (සිවිල්) 60 ක් ද කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණි.

(ආ) ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 1.2 වගන්තිය අනුව පත්කිරීමක් කළ යුත්තේ අනුමත සේවක සංඛ්‍යාවේ තනතුරුවලට පමණි. නමුත්, අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා තනතුරු 28 ක් සඳහා අතිරික්ත සේවකයින් 550 දෙනෙකු 2018 දෙසැම්බර් 31 දිනට බඳවාගෙන තිබුණි.

(ඇ) 2006 අගෝස්තු 01 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 28 (ii) සහ 2009 නොවැම්බර් 25 දිනැති අංක ඩීඑම්එස්/ඊ3/43/4/265/1 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව නව තනතුරු ඇති කිරීම හෝ පුරප්පාඩු පිරවීම නොකළ යුතු බවට දැනුවත් කර තිබුණි. කෙසේ වුවත්, අනුමැතිය ලබා නොගත් තනතුරු 05 ක් සඳහා සේවකයින් 07 ක් පත්කර තිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

------------------------------------------

**4.1 සංයුක්ත සැලැස්ම**

---------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය වෙනුවෙන් සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණි. සමාලෝචිත වර්ෂයට අදාලවඑම සැලසුම යාවත්කාලීන කර නොතිබුණි. සංයුක්ත සැලැස්මෙහි ඇතුළත්ව තිබූ අරමුණු හා පරමාර්ථ ලඟා කරගැනීමට අපොහොසත් වූ අවස්ථා නිරීක්ෂණය විය.
සංයුක්ත සැලැස්ම තුළ වූ පහත සඳහන් ඉලක්ක අපේක්ෂිත පරිදි ඉටු කරගෙන නොතිබුණි.

(අ) සංස්ථාවේ එක් එක් අංශයේ අවම සාමාන්‍ය වාර්ෂික ආදායම සියයට 05 කින් වැඩි කිරීම සහ ව්‍යාපෘතිවලින් සියයට 05 ක අමතර වාර්ෂික ආදායමක් උපයා ගැනීම.

(ආ) ණය ආපසු අය කිරීම සඳහා පද්ධතියක් හඳුන්වා දීම සහ වර්තමාන ණය මට්ටම සියයට 20 කින් අඩු කිරීම.

(ඇ) නව ආදායම් ඉපයීම් ක්ෂේත්‍රයන් හඳුනා ගැනීම හා ව්‍යාපාර කටයුතු විවිධාංගීකරණය කිරීම යටතේ ව්‍යාපාරික කටයුතු පුළුල් කිරීම.

## 4.2 ක්‍රියාකාරී සැලැස්ම

-----------------------

සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණද, එම ක්‍රියාකාරී සැලැස්ම තුළ සඳහන් අරමුණු, උපායමාර්ග සහ ක්‍රියාකාරකම් සපුරා ගැනීම සඳහා ගතවන කාලය නිර්ණය කර නොතිබුණි. 2014 පෙබරවාරි 17 දිනැති අංක පීඑෆ්ඩී/ආර්ඊඩී/01/04/2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය පරිදි පහත සඳහන් මූලික අයිතම එහි ඇතුළත් කර නොමැති බව තවදුරටත් නිරීක්ෂණය විය.

(i) ආදායම, මෙහෙයුම් වියදම්, සංවර්ධන වියදම්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ඇතුලත් වූ වාර්ෂික අයවැය.

(ii) යෝජිත ප්‍රධාන ආයෝජන, ධාරිතා ඉහල නැංවීම හා ප්‍රධාන ප්‍රසම්පාදනයන් ඇතුළත් වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම.

(iii) මානව සම්පත් සංවර්ධන සැලැස්ම.

(iv) ණය ආපසු ගෙවීමේ සැලැස්ම.

(v) අභ්‍යන්තර විගණන සැලැස්ම.

## 4.3 අයවැය ලේඛනමය පාලනය

--------------------------------

ගිණුම් වර්ෂයට දින 15 කට පෙර, වාර්ෂික අයවැය රේඛීය අමාත්‍යාංශය, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව සහ විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, එය 2018 පෙබරවාරි 08 දින ඉදිරිපත් කර තිබුණි. සෑම මාසයක් සඳහාම අයවැය සකස් කර තිබුණද, අයවැය හිඟය මූල්‍යන ක්‍රමවේදය පෙන්වා දී නොතිබුණි.

## 4.4 වාර්ෂික වාර්තා සභාගත කිරීම

----------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්තිය ප්‍රකාරව, සංස්ථාව විසින් 2015 හා 2016 වර්ෂයන්ට අදාල වාර්ෂික වාර්තා 2019 ජූලි 20 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

---------------------------

විගණන කටයුතු තුලදී පද්ධති හා පාලනයන්හී නිරික්ෂණය වූ අඩුපාඩු වරින්වර සංස්ථාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත දැක්වෙන කේෂ්ත්‍ර හා පාලනයන් සම්බන්ධයෙන් විශේෂ අවධානයක් අවශ්‍ය වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) මූල්‍ය පාලනය | (i) ඇණවුම් සමග චෙක්පත් මඟින් අත්තිකාරම් ලබා දීම |
| | (ii) වර්ෂ ගණනාවක සිට පැවත එන ණයගැතියන්ගෙන් මුදල් අයකර නොගෙන පැවතීම. |

| | | |
|---|---|---|
| | (iii) | සේවාදායකයින් සඳහා ඉන්වොයිස් ඉදිරිපත් කිරීමට සැලකිය යුතු ප්‍රමාදයන් පැවතීම |
| | (iv) | ගැණුම් අත්තිකාරම් නිරවුල් නොකර දීර්ඝ කාලයක සිට පැවතීම. |
| | (v) | ඉදිකිරීම්වලට අදාල දිගුකාලීන රඳවා ගැනීම් මුදල් නිරවුල් කිරීමට අපොහොසත් වීම. |
| (ආ) වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ | (i) | දිගු කාලයක සිට නිරවුල් නොකරන ලද සවලීකරණ අත්තිකාරම් පැවතීම. |
| | (ii) | නියමිත කාලය තුල බදු ගෙවීමට අපොහොසත් වීම තුළ අධිභාර ගෙවීමට සිදුවීම |
| (ඇ) කාර්ය මණ්ඩල පරිපාලනය | (i) | වෙනත් ආයතන වෙත මානව සම්පත් මුදා හැරීම |
| | (ii) | අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා සේවකයින් බඳවා ගැනීම. |
| | (iii) | ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම් කිරීම. |
| (ඈ) වත්කම් කළමනාකරණය | | ඉඩම් අයිතිය පවරා ගැනීමට හා නිෂ්කාර්ය වත්කම් විධිමත් පරිදි උපයෝජනය කිරීමට කටයුතු කිරීමට අපොහොසත් වීම. |
| (ඉ) තොග පාලනය | | සියළු වැඩබිම්වල වාර්ෂික තොග සමීක්ෂණ සිදු කිරීමට අපොහොසත් වීම. |